සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා
ර/නිවි/රඹුක මහා විද්‍යාලය , කලවාන.

Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

1- කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

  - නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න

1. උඩරට නර්තන සම්ප්‍රදායේ ගැට ගැටබෙරයේ වම් ඇස මැදට පුපුරා යන ලෙස ගැසීමෙන් උපදින බීජාක්ෂර වන්නේ,

   1. තත් 2. ජිත් 3. තොං 4. නං

2. "ඉර සඳ පාන විල කොතැනද තුන් හිරියා" මෙම කවියේ අවසාන පදය වන්නේ,

   1. ඉර සඳ පාන විල මෙතනයි තුන්හිරියා
   2. පැදුරක් වියන්නට පන් දෙනවද තුන් හිරියා
   3. පන්කම් කරන අගනෝ කාටත් සරියා
   4. මට පැදුරකට පන් දෙනවද තුන්හිරියා

3.සබරගමු වන්නම් ගණනින්,

   1. 18 2. 26 3. 24 4. 32

4. "දේවදාසීන් සිටි බව හා ඔවුන් නර්තනයේ යෙදුණු බව" සඳහන් වන්නේ,

   1. කොරවක් ගල් ලෙන් ලිපියේ ය 2. සැස්සේරුව සෙල්ලිපියේ ය
   3. තිසර සන්දේශයේ ය 4. කාලිංග වනෝද්‍යානයේ ගල්ආසන ලිපියේය

5 ."ගත්ත තෙහිගු තකට තකුද" මෙම අඩව්වට අදාල තිත් රූපය වනුයේ,

   1. 2+4 2. 3+4 3. 3+3 4. 2+3

6. "නිලුපුල් දිගැ සී දිගැසී තන රණ තලසී" යන කාව්‍යයේ තුන්වන පදය වන්නේ,

1. දුටු එම විගසී මද තෙම ඇවිසී　　2. විදුලිය සදිසී සියුමැලි දිගැසී

3. රග බැස නොසලී රග දෙන විලසී　　4. තඹ රතු ගැනකී සිවුබඹ ගැලසී

7. උඩරට වන්නමක කොටස් ගණනින්,

1. හතරකි　　2. තුනකි　　3. පහකි　　4. හයකි

8. දොළොස්වන පා සරඹ නාමය වන්නේ,

1.සුරල් අඩිය　　2. දෙපැති අඩිය　　3. දැල හරඹය　　4. චන්ද්‍රිකා සරණය

9. "ගත්ත තෙහිගු ............ තකුද, තක්කඩ .............. තරිකිට" හිස්තැනට අදාල වරණය වන්නේ,

1. කුදට, කඩ　　2. දොංත, කුංදට

3. තකට, ජික්කඩ　　4. තකට, දොං දොං

10. ප්‍රස්තාරකරණයේ දී යොදා ගන්නා තාල සංකේත සංකේත ඇතුළත් වරනය වන්නේ,

1. /,∧　　2. ‿,∧　　3. –, /　　4. –,+

ලකුණු 1×10 = 10

- හරි වැරදි ලකුණු කරන්න

1. ශෝකය නැමැති ස්ථායි භාවයෙන් උපදින්නේ කරුණා රසයයි.　( )
2. රංග උපකරණ භාවිතා කරන්නේ ගැමි නැටුම් වල දී පමණි.　( )
3. එකොළොස්වන පා සරඹය චක්‍ර අඩියයි.　( )
4. ශාන්තිකර්මවලදී භාවිතයට ගන්නා රංග උපකරණයක් ලෙස කුල්ල ගත හැකිය.　( )
5. උඩරට කලාසම ට සමාන සබරගමු නර්තන සම්ප්‍රදායේ පදය වන්නේ තීරුමාරුවයි.　( )

ලකුණු 2×5 = 10

- සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න

1. ශාන්තිකර්මවල ........................................................ ගැමි නැටුමේ කවි ගායනා කරයි.
2. දේවදාසීන් හත්දෙනකු පිදූ බව ........................................................ හි සඳහන් වෙයි.
3. ..................................................... ගොයම් කැපීමේ නැටුමේදී යොදා ගන්නා රංග උපකරණයකි.
4. පන් කපා ගැනීමට ........................................................ භාවිතා කරයි.
5. සිංහරාජ වන්නම ........................................................තනි තිතට නර්තනය කරයි.

ලකුණු 2×5 = 10

11 - කොටස

1. 1. ගැමි නැටුම් ගැන කෙටියෙන් හඳුනවන්න (ලකුණු -05)

2. පන් කවියක් හා ගොයම් කවියක් ලියන්න (ලකුණු -05)

2. 1. නර්තන සම්ප්‍රදායන් තුනේ ප්‍රධාන ශාන්තිකර්ම තුන ලියන්න (ලකුණු -03)

2. පුද ලබන දෙවිවරුන් දෙදෙනෙක් නම් කරන්න (ලකුණු -02)

3. චාරිත්‍ර විධීන් දෙකක් නම් කරන්න (ලකුණු -02)

4. නර්තන තුනක් නම් කරන්න (ලකුණු -03)

***